# 16

# අන් අයගේ අවශ්‍යතාවයට ප්‍රමුඛත්වය දෙමු

දිනක් නබි (සල්) තුමා වෙත  පුද්ගලයෙක් පැමිණියේ ය. ඔහු තම දුප්පත්කම ගැන පැමිණිලි කළේය. ඔහුට කෑමට දීමට තම නිවසේ කිසිවක් නොතිබූ නිසා ඔහුට කෑම සපයන ලෙස සහාබාවරුන් වෙතින් නබි (සල්) තුමාණෝ ඉල්ලා සිටියහ. මම ඔහුට කෑම සපයන්නෙමි යි පවසමින් අන්සාරිවරයෙක් ඔහු තම නිවසට කැඳවාගෙන ගියේය. ඔහු අපේ අමුත්තෙක්. කිසිම අඩුපාඩුවක් නැතිව මොහුට ආහාර සැපයිය යුතු යැයි සිය බිරිඳට කීවේ ය. නිවසේ තිබෙන්නේ දරුවන්ට අවශ්‍ය ආහාර පමණක්  බව බිරිඳ පැවසූ විට, එය ගෙනැවිත් අමුත්තාට තබන ලෙසත් දෙදෙනා ම කෑම කන්නට පටන් ගන්නා අවස්ථාවේ පහනේ ආලෝකය වැඩි කරන බව අඟවමින් පහන නිවා දමන ලෙසත් කීවේය. බිරිඳ ද එසේ  කළා ය. අමුත්තා කුස පිරෙන්නට කෑවේ ය. පසුදින නබි (සල්) තුමා වෙත මෙම අන්සාරිවරයා ගිය විට 'ඔබගේ ආගන්තුක සත්කාරය පිළිබඳ අල්ලාහ් සතුටට පත් වී ඇත' යනුවෙන් නබි (සල්) තුමා පැවසුවේ ය. පහත සඳහන් අල්කුර්ආන් වැකිය පහළ වුයේ ද එම අවස්ථාවේ දී ය.

"තමන් ට අවශ්‍යතා තිබිය දී තම අවශ්‍යතාවට වඩා වෙන අයෙකුගේ අවශ්‍යතාවට ප්‍රමුඛත්වය ලබා දෙති"  59 : 9

අපි හැමවිට ම සියලු ජනතාව සමඟ කරුණාවෙන් හැසිරිය යුතු බව අවධාරණය කරයි. අන් අය කෙරෙහි කරුණාව දැක්විය යුතුයි. හැකි සියලු ම උදව් කළ යුතු ය. අන් අයගේ දුක ඉවත් කිරීමට වෑයම් කළ යුතුය. උදව් පතන සියල්ලන් ගැනම සිතිය යුතු ය. අපගේ අවශ්‍යතාවට වඩා අන් අයගේ අවශ්‍යතාවයන්ට හැකි පමණින් ප්‍රමුඛතාව දිය යුතු ය. මක් නිසා ද යත් මිනිසාට අනුකම්පා නො දක්වන අය කෙරෙහි  අල්ලාහ් ද අනුකම්පා නොදක්වන බව නබි (සල්) තුමා පවසා ඇත. (බුහාරි)

අපට මෙන් ම අන් අයට ද අවශ්‍යතා ඇත. අයෙකුට තම අවශ්‍යතාව තනියම සපුරා ගැනීමට නොහැකි වන අවස්ථාවේ දී අන් අයගේ උදව්ව බලාපොරොත්තු වෙයි. එවැනි අවස්ථාවල අපගේ අවශ්‍යතාව පසුවට තබා අන් අයගේ අවශ්‍යතාවය ඉටු කර දිය යුතු ය. මෙය ඉතා වැදගත් ගුණාංගයක් වන්නේ ය. මෙ ලොවෙහි දී මුඃමින් වරයෙකුගේ දුකෙන් එකක් අයෙකු ඉවත් කළේ නම් අල්ලාහ් කියාමාවේ ඔහුගේ දුකෙන් එක් දුකක් ඉවත් කරන්නේ ය. දුක් විඳින්නාට උදව් කර පහසුවක් ඇති කළේ නම් අල්ලාහ් ඔහුගේ දුක මෙලොවෙහි දී හා පරලෙවෙහි පහසු කරන්නේ ය" යැයි නබි (සල්) තුමා පවසා ඇත. (මුස්ලිම්)

අප හදිස්සි අවශ්‍යතාවක් සඳහා යමින් සිටිනවා යැයි සිතමු. එම අවස්ථාවේ දී ඇස් නොපෙනෙන අයෙකු පාර නො දැන අතපත ගාමින් සිටිනවා යැයි සිතමු. වයෝවෘද්ධ පුද්ගලයෙකු බසයේ හිටගැනීමට බැරිව අසීරුවෙන් ගමන් කරන්නේ යැයි සිතමු. රෝහලේ වෛද්‍යවරයා හමු වීමට පෝලිමේ සිටින අවස්ථාවක් ගැන සිතමු. අපගේ වාරය පැමිණෙන විට අමාරු රෝගියෙක් පැමිණෙයි, නම් අපගේ අවශ්‍යතාව පමාකර ගනිමින් අන් අයගේ අවශ්‍යතාවට මුල් තැන දිම උතුම් ගුණාංගයකි.

මුහාජිරීන්වරු මක්කාවේ සිට තම ගෙවල් දොරවල් අතහැර මදීනාවට පැමිණියහ. ඔවුන් සියල්ල අහිමි ව පැමිණි අවස්ථාවේ දී මදීනාවේ අන්සාරිවරු ඔවුන් තම සහෝදරවරුන් වශයෙන් පිළිගත්හ. අන්සාරිවරු තම අවශ්‍යතා ගැන නොසළකා අන් අයගේ අවශ්‍යතාවලට ප්‍රමුඛතාව දුන්හ. නබි (සල්) තුමාණෝ තමාට වඩා අවශ්‍යතාව වැඩි මුහාජිරීන්වරුන්ට තමාට ලැබෙන පරිත්‍යාග පවා ලබා දුන්හ. මක්නිසා ද යත් අන් අයගේ අවශ්‍යතාවට ප්‍රමුඛතාව දීම මුස්ලිම්වරුන්ගේ උතුම් ගුණාංගයක් වන බැවිනි.

ගැත්තෙක් තවත් ගැත්තෙකුට උදව් කරමින් සිටින තාක් කල් එම ගැත්තාට අල්ලාහ්ගේ උදව්ව ලැබෙමින් පවතින බව නබි (සල්) තුමාණෝ වදාළහ. (මුස්ලිම්)

සමහර අවස්ථාවල දී සහෝදරයන් අතර ද මිත්‍රවරුන් අතර ද සමහර මතභේද ඇති වන්නේ ය. මෙයට වෙනස් ව අන් අයගේ අවශ්‍යතාවනට ප්‍රමුඛතාව දෙන්නට පුරුදු වූයේ නම් සියල්ලන්ගේ ජීවිතය සතුටුදායක වන්නේ ය.

"ඔබ අතරින් එක්කෙනෙක් තමා කැමැති දේ තම සහෝදරයාට ද කැමැති වන තෙක් ඔබගෙන් කිසිවකු සැබෑ විශ්වාසවන්තයකු නොවන්නේ ය" යැයි නබි (සල්) තුමා පවසා ඇත. (බුහාරි, මුස්ලිම්)

සහාබාවරු සැම විටම අන් අයගේ අවශ්‍යතාවට ප්‍රමුඛතාව දී ඇත්තාහ. මෙයට සාධකයක් වශයෙන් පහත සිද්ධිය දැක්විය හැකි ය. යර්මුක් යුද්ධයෙන් පසු ව යුද පිටියේ බොහෝ අය තුවාල ලබා අඩපණ ව වැටී උන්හ. ඔවුනට ජලය පෙවීම සඳහා අයෙක් ජලය ගෙන ගියේ ය. කෙනකුට ජලය පොවන්නට ඉදිරිපත් වූ විට තවත් අයෙකු ජලය ඉල්ලා කෑගසන හඬ ඇසුණි. එය ඇසුණු ඔහු දෙවැන්නාට ජලය පොවන ලෙස ඉල්ලා සිටියේ ය. දෙවැන්නා වෙතට ජලය රැගෙන ගිය අවස්ථාවේ දී තුන්වැන්නකු ජලය ඉල්ලා කෑගසන හඬ ඇසුණි. ඔහු තමාට නොව තුන්වැන්නාට ජලය පොවන ලෙස ඉල්ලා සිටියේ ය. නමුත් තුන් වැන්නා වෙතට ජලය රැගෙන ගිය අවස්ථාවේ දී ඔහු මරණයට පත් වී සිටියේ ය. එවිට දෙවැන්නා වෙත ජලය රැගෙන යන ලදින් ඔහු ද මරණයට පත් ව ඇති බව දක්නා ලදි. එවිට ජලය පළමුවැන්නා වෙත රැගෙන යන ලදි. ඔහු ද ජලය පානය නොකර ම මිය ගොස් සිටියේ ය.

මෙම සිද්ධියේ දී තම මරණාසන්න මොහොතේ පවා තම අවශ්‍යතාවට වඩා අන් අයගේ අවශ්‍යතාවට මුල් තැන දුන් මහත්මා ගුණය දකින්නෙමු.

එහෙයින් අප අප ගැන පමණක් නොසිතා අන් අය දෙස ද අවධානය යොමු කළ යුතු ය. නබි (සල්) තුමාණෝ තම අවශ්‍යතාවට වඩා අන් අයගේ අවශ්‍යතාවට මූලිකත්වය දී ඇත්තාහ. එසේ කටයුතු කරන ලෙස අන් අයට ද උපදෙස් දී ඇත්තාහ. අපට හැකි පමණින් අන් අයට ඉඩ හැර දීමත් ඒ අයගේ අවශ්‍යතාවන්ට ප්‍රමුඛතාව දී කටයුතු කිරීමටත් යොමු වෙමු.

අභ්‍යාස

**වරහන තුළ ඇති වඩාත් සුදුසු වචනය තෝරා එයට යටින් ඉරි අඳින්න**

1. අන් අයගේ අවශ්‍යතාවන්ට (අල්ලාහ් වෙනුවෙන්, හෘදසාක්ෂිය වෙනුවෙන්, මිනිසුන් වෙනුවෙන්) මුල් තැන දිය යුතුය.
2. මිනිසුනට සෙනෙහස දක්වන අයට (මලායිකාවරු, නබිවරු, අල්ලාහ්) සෙනෙහස දක්වයි.
3. තම අවශ්‍යතාවන්ට වඩා මුහාජිරීන්වරුන්ගේ අවශ්‍යතාවන්ට (සහාබාවරු, අන්සාරිවරු, කුරයිෂිවරු) මුල් තැන ලබා දුන්හ.
4. අප අතර සණ්ඩු දබර ඇති වීමට ඇති ප්‍රධාන හේතුවක් වනුයේ (ආත්මාර්ථකාමිත් වය, ශාරීරික ශක්තිය, පරාර්ථකාමිත්වය)
5. සමහර සහාබාවරුහු තම මරණාසන්න මොහොතේ පවා ජලය පානය නොකර මෙලොවින් සමු ගත්හ. (තිබහ නොමැතිකම, ජලය නොලැබීම, අන් අයගේ තිබහ සංසිඳවන්න ඉදිරිපත් වීම) නිසා ය.